# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2369/26 - 2024 පෙබරවාරි මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2024.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 4/2011

විධාන අංක : 93

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(ආ)(ii) වන වගන්තිය යටතේ වූ විශේෂ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පාරිභෝගික කටයුතු අධිකාරියේ සභාපති, ශාන්ත නිරිඇල්ල වන මා විසින්, පාරිභෝගිකයාගේ ආරක්ෂාව සඳහා -

(අ) මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති යම් පාන් වර්ගයක් -

(i) සකස් කිරීමේ, ඇසුරුම් කිරීමේ, ගබඩා කිරීමේ හෝ තොග වශයෙන් විකිණීමේ නිරතව සිටින යම් සාදන්නකු; හෝ

(ii) සිල්ලර වෙළෙඳාමේ නිරතව සිටින හෝ විකිණීමට අර්පණය කරන හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන යම් වෙළෙන්දකු

විසින්, අවස්ථාවෝචිත පරිදි, සකස් කිරීම, ඇසුරුම් කිරීම, ගබඩා කිරීම, විකිණීම සඳහා අර්පණය කිරීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම කරනු ලබන හෝ සිල්ලර හෝ තොග වශයෙන් විකුණනු ලබන එවැනි එක් එක් පාන් වර්ගයක එකී උපලේඛනයේ 2 වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති බර අඩංගු විය යුතු බවට වගබලා ගතයුතු බවටත්;

(ආ) මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති එක් එක් පාන් වර්ගය සඳහා ඉඩ දිය හැකි ඌනතාව, එම උපලේඛනයේ 3 වන තීරයේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු බවටත්; සහ

(ඇ) විකිණීමට අර්පණය කර ඇති හෝ විකිණීමට ප්‍රදර්ශනය කර ඇති යම් පාන්වල බර පැහැදිලිව සහ ප්‍රකටව පෙනෙන පරිදි ප්‍රදර්ශනය කළ යුතු බවටත්;

මෙයින් විධානය කරනු ලැබේ.

සභාපති,
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.

2024 පෙබරවාරි මස 01 වන දින
කොළඹ දී ය.


1A - PG 6634 — 81 (2024/02)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

මෙම විධානයේ කාර්යය සඳහා -

"ඉඩදිය හැකි ඌනතාව" යන්නෙන්, නියමිත බරට වඩා අඩුවෙන් තිබීමට ඉඩදෙනු ලබන ප්‍රමාණය අදහස් වේ.

**උපලේඛනය**

| පාන් වර්ගය | නියමිත බර (ග්‍රෑම්) | ඉඩදිය හැකි ඌනතාව (ග්‍රෑම්) |
|---|---|---|
| පාන් ගෙඩියක් | 450 | 13.5 |
| පාන් භාගයක් | 225 | 09 |

EOG 01- 0247

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.